C
372
EKA

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

# සදාචාර අගයයන් ජනිත කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ද්විතීයික පාසල් විෂයමාලාවේ විෂය සමගාමී කටයුතු උපයෝගී කර ගැනීම පිළිබඳව කෙරෙන විමර්ශනයක්.

( මහනුවර දිස්ත්‍රික්කය ඇසුරෙන් )

# A study to assess the inculcation of moral values through co-curricular activities in the secondary schools in Sri Lanka.

(Based on a sample drawn from the Kandy district)

ඊ. ඩබ්. එම්. සී. එම්. ඒකනායක
B.A., Dip. in Education (Distinction)

අධ්‍යාපන දර්ශනපති උපාධි නිබන්ධනය
අධ්‍යාපන විද්‍යා අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය
ශ්‍රී ලංකාව

1997

පර්යේෂණ උපදේශක
ආචාර්ය එල්. ඊ. කොබ්බැකඩුව මහත්මිය
අධ්‍යාපන විද්‍යා අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය

523127

UNIVERSITY OF PERADENIYA
28-12-1999
LIBRARY

# සාර සංග්‍රහය

දැනුම, ආකල්ප සහ කුසලතා වලින් පිරිපුන් සදාචාර සම්පන්න වූ පුරවැසියන් බිහි කිරිම අධ්‍යාපනයේ පරමාර්ථයවේ. පාසල් පද්ධතිය තුලින් මෙම කාර්යය සපුරා ගැනීමේ දී විෂයමාලාව මගින් සිදු කෙරෙන මෙහෙය බෙහෙවින් වැදගත්වේ. පන්ති කාමර ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලිය තුලින් බොහෝ දුරට සදාචාර අගයයන් සම්ප්‍රේෂණය කල හැකිය. එමෙන්ම ඊට නොදෙවෙනි ආකාරයෙන් විෂය සමගාමී කටයුතුවලින් එම කාර්යය කල හැකිවේ. ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයන් මගින් සදාචාර අගයයන් අත්දැකීමට සිසුන්ට එමගින් අවස්ථාව ලැබේ. එබැවින් සදාචාර අගයයන් පිළිබඳ ආකල්ප ශිෂ්‍යයන් තුල ජනිත කිරිම සඳහා විෂයමාලාවේ විෂය සමගාමී කටයුතු උපයෝගි කර ගැනීම පිළිබඳව විමසා බැලීම සඳහා අධ්‍යයනයක් කිරිම කාලෝචිත යයි අප විසින් අදහස් කෙරුණි.

මෙම අධ්‍යයනය සඳහා විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය භාවිතා කරන ලදී. ඒ යටතේ ද්විතියික පාසලේ 8 වසර සිට 13 වසර දක්වා විෂය සමගාමී කටයුතුවලට සහභාගි වන සිසුන්ගේ නියැදියක් යොද ගැනුණි. මෙහිදී මහනුවර දිස්ත්‍රික්කයේ පාසල් පමණක් නියැදියට ඇතුලත් විය. විෂය සමගාමී කටයුතුවලට සම්බන්ධ කරමින් කොතෙක් දුරට සදචාර අගයයන් ජනිත කල හැකිදැයි විමසා බැලීම පර්යේෂණයේ මූලික අරමුණ විය.

සදාචාර අගයයන් ජනිත කිරිම සම්බන්ධයෙන් ශිෂ්‍ය ප්‍රතිචාර විමසා බැලීමේ දි විෂය සමගාමී කටයුතු ඒ සඳහා බෙහෙවින් ඉවහල් වන බව අධ්‍යයනයෙන් පැහැදිලි විය. එමෙන්ම පාසල් කළමනාකරුවන්, ගුරුවරුන් සහ අධ්‍යාපන විශේෂඥයන්ගේද අදහස්වලින් පැහැදිලි වන්නේ ශිෂ්‍ය ප්‍රතිචාරවලින් ලැබුණු නිගමන සනාථ වන බවයි.

පර්යේෂණය අවසානයේ පර්යේෂකයා විසින් උත්සාහ ගෙන ඇත්තේ, සදාචාර අගයයන් ඇතිකිරිම සම්බන්ධයෙන් විෂය සමගාමී කටයුතු යොදා ගැනීමේ දි වර්තමානයේ පවතින තත්ත්වයට වඩා ප්‍රතිඵලදායක ආකාරයෙන් පාසල තුල විෂය සමගාමී කටයුතු ක්‍රියාත්මක කල හැකි ආකාරය පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරිමයි.

මිනිස් සමාජයක පැවැත්ම රඳා පවතින අත්‍යවශ්‍ය සාධක අතර ප්‍රධාන තැනක් ගන්නා 'සදාචාරය' යන සංකල්පය සම්බන්ධයෙන් පිරිහීමක් පෙන්නුම් කරන මෙවන් අවධියක අධ්‍යාපන ක්ෂෙත්‍රය මගින් සදාචාරය පිළිබඳව යථා මාර්ගෝපදේශකත්වයක් සැපයීමේ හැකියාව අනාවරණය කරගැනිම සඳහා ගත් උත්සාහයක් ලෙස මෙම පර්යේෂණය හඳුන්වාදිය හැකිවේ.